# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව

+94 11 2477424 / +94 11 2477421 +94 11 2346304

communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk


**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2026 අප්‍රේල් 30 |

# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2026 මාර්තු

## මුළු අපනයන
භාණ්ඩ හා සේවා

**එ.ජ.ඩො. මිලියන 1,796**
2026 මාර්තු මාසයේ දී
-5.8% ▼ (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

**එ. ජ. ඩො. මිලියන 5,391**
2026 ජන. - මාර්. මාස තුළ දී
0.2% ▲ (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

### භාණ්ඩ අපනයන

**එ.ජ.ඩො. මිලියන 1,254**
2026 මාර්තු මාසයේ දී
1.0% ▲ (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

**එ.ජ.ඩො. මිලියන 3,461**
2026 ජන. - මාර්. මාස තුළ දී
3.4% ▲ (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

### සේවා අපනයන

**එ.ජ.ඩො. මිලියන 542**
2026 මාර්තු මාසයේ දී
-18.5% ▼ (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

**එ.ජ.ඩො. මිලියන 1,930**
2026 ජන. - මාර්. මාස තුළ දී
-5.2% ▼ (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

## සංචාරක ඉපැයීම්

**එ.ජ.ඩො. මිලියන 224***
**(සංචාරක පැමිණීම් : 183,979)**
2026 මාර්තු මාසයේ දී

**එ.ජ.ඩො. මිලියන 954**
**(සංචාරක පැමිණීම් : 740,634)**
2026 ජන. - මාර්. මාස තුළ දී



* ශ්‍රී ලංකා සංවර්ධන අධිකාරිය විසින් සංශෝධනය කළ සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම් වේ.



## වෙළඳ හිඟය

**එ.ජ.ඩො. මිලියන 880**
2026 මාර්තු මාසයේ දී

**එ.ජ.ඩො. මිලියන 2,310**
2026 ජන. - මාර්. මාස තුළ දී

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ **

**එ.ජ.ඩො. මිලියන 815**
2026 මාර්තු මාසයේ දී

**එ.ජ.ඩො. මිලියන 2,295**
2026 ජන. - මාර්. මාස තුළ දී

** විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට දිට්වා සුළි කුණාටුවෙන් පසුව ලැබුණු ප්‍රේෂණ වැනි වෙනත් ප්‍රේෂණ ඇතුලත් විය හැකිය.

## දළ නිල සංචිත ***

**එ.ජ.ඩො. බිලියන 7.0**
2026 මාර්තු මස අවසානයට



**ආනයනික ආවරණය**
**මාස 3.8**

*** චීන මහජන බැංකුව සමඟ වන විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළුව.

## භාණ්ඩ ආනයන

**එ.ජ.ඩො. මිලියන 2,134**
2026 මාර්තු මාසයේ දී
30.3% ▲ (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)

**එ.ජ.ඩො. මිලියන 5,771**
2026 ජන. - මාර්. මාස තුළ දී
18.1% ▲ (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)



## විනිමය අනුපාතිකය
(එ.ජ. ඩොලරයට රුපියල්)




**2.9%**
2026 වසරේ අප්‍රේල් මස අවසානය දක්වා කාලය තුළ දී අවප්‍රමාණය



## ජංගම ගිණුමේ ශේෂය

**එ.ජ.ඩො. මිලියන 45**
2026 මාර්තු මාසයේ දී

**එ.ජ.ඩො. මිලියන 531**
2026 ජන. - මාර්. මාස තුළ දී



# විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශය

# 2026 මාර්තු

- 2026 වසරේ මාර්තු මාසයේ දී විදේශීය ජංගම ගිණුමෙහි සුළු අතිරික්තයක් වාර්තා වූ අතර, පෙර වසරට සාපේක්ෂව වෙළඳ හිඟය පුළුල් වීම සහ සේවා ගිණුමේ අතිරික්තය අඩු වීම මධ්‍යයේ වුවද, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යෑම සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය අඩු වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2026 වසරේ පළමු කාර්තුව තුළ දී ජංගම ගිණුමේ සමුච්චිත අතිරික්තය එ.ජ. ඩොලර් මිලියන 531ක් ලෙස වාර්තා විය.

- අපනයනවලට සාපේක්ෂව ආනයනවල ඉහළ වර්ධනය පිළිබිඹු කරමින් 2026 වසරේ මාර්තු මාසයේ දී වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය පුළුල් විය. 2026 වසරේ පළමු කාර්තුවේ දී, වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 1.5ට සාපේක්ෂව එ.ජ. ඩොලර් බිලියන 2.3ක් දක්වා පුළුල් විය.

- මැද පෙරදිග පවතින යුද්ධය හේතුවෙන් ඉන්ධන මිල ගණන් සහ ආනයන පරිමාවන් ඉහළ යෑම මත 2026 වසරේ මාර්තු මාසයේ දී ඉන්ධන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 630ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 74.7%කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

- පෞද්ගලික සහ වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා වාහන ඇතුළුව වාහන ආනයන වියදම 2026 වසරේ මාර්තු මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 195ක් වූ අතර, 2026 වසරේ පළමු කාර්තුව තුළ දී මුළු වාහන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 613ක් විය.

- ආනයන මිල ගණන් පහළ යෑම ඉක්මවා අපනයන මිල ගණන් පහළ ගිය බැවින්, 2026 වසරේ මාර්තු මාසයේ දී වෙළඳ මිල අනුපාතය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහළ ගියේය. මේ අතර, 2026 වසරේ පළමු කාර්තුවේ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරට සාපේක්ෂව සුළු වශයෙන් පහළ ගියේය.

- සංචාරක ඉපැයීම්වල අඩු වීම හේතුවෙන්, 2026 වසරේ මාර්තු මාසයේ දී සේවා ගිණුමේ අතිරික්තය එ.ජ. ඩොලර් මිලියන 227ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 42.4%කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. 2026 වසරේ පළමු කාර්තුව සඳහා සේවා ගිණුමේ සමුච්චිත අතිරික්තය, 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 20.2%කින් අඩු විය.

- මැද පෙරදිග කලාපයේ පවතින යුදමය වාතාවරණය හේතුවෙන් මෑත මාසවල දී සංචාරක ක්ෂේත්‍රය තුළ දක්නට ලැබුණු ස්ථාවර වර්ධනය ආපසු හැරුණු අතර, 2026 වසරේ මාර්තු මාසයේ දී සංචාරක පැමිණීම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 19.8%ක සැලකිය යුතු ලෙස පහළ යෑමක් පිළිබිඹු කරමින්, 183,979ක් දක්වා පහළ ගියේය. 2026 වසරේ මාර්තු මාසයේ දී සංචාරක ඉපැයීම්[1] එ.ජ. ඩොලර් මිලියන 224ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇති අතර, 2026 වසරේ පළමු කාර්තුව තුළ දී සමුච්චිත ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 954ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 15.0%කින් පහළ ගියේය.

- 2026 වසරේ මාර්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ[2] එ.ජ. ඩොලර් මිලියන 815ක් දක්වා ඉහළ ගිය අතර, එය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 17.5%ක වර්ධනයක් වාර්තා කළේය. සමුච්චිත වශයෙන්, වසරේ පළමු කාර්තුව තුළ දී ප්‍රේෂණ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 26.5%ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය.

- 2026 වසරේ මාර්තු මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි එ.ජ. ඩොලර් මිලියන 64ක ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් කොළඹ කොටස් වෙළඳපොළෙහි එ.ජ. ඩොලර් මිලියන 10ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.

- 2026 වසරේ මාර්තු මස අග වන විට, චීන මහජන බැංකුව සමඟ වන විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළත්ව, දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 7.0ක් විය. මහ බැංකුව විසින් විදේශ විනිමය මිලදී ගනු ලැබුව ද, විදේශ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම මාසය තුළ දී දළ නිල සංචිත පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය.

- 2026 වසරේ පෙබරවාරි මස අග භාගයේ දී මැද පෙරදිග ගැටුම ආරම්භ වීමෙන් පසු ඇති වූ විදේශීය අංශයේ පීඩනයන් මධ්‍යයේ, 2026 වසරේ අප්‍රේල් මස අවසානය වන විට, ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව 2.9%කින් අවප්‍රමාණය විය.

සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන මාසික විදේශීය අංශ විවරණිකාවෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ විදේශීය අංශ සංඛ්‍යාලේඛන වෙබ් පිටුවලින් ලබා ගත හැකි අතර, ඒවාට පහත වෙබ් සබැඳි හරහා ප්‍රවේශ විය හැකිය:

https://www.cbsl.gov.lk/en/external-sector-bulletin
https://www.cbsl.gov.lk/en/statistics/statistical-tables/external-sector

[1] *ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංචාරකයෙකු විසින් එක් දිනක් තුළ දරන වියදමෙහි සාමාන්‍යය 2025 වසරේ අගෝස්තු මාසයේ සිට සංශෝධනය කරන ලදී.*

[2] *විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට දිට්වා සුළි කුණාටුවෙන් පසුව ලැබුණු ප්‍රේෂණ වැනි වෙනත් ප්‍රේෂණ ඇතුළත් විය හැකිය.*

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශය (අ)

| කාණ්ඩය | 2025 මාර්තු (එ.ජ.ඩොලර් මිලියන) | 2026 මාර්තු (එ.ජ.ඩොලර් මිලියන) | වෙනස (%) | 2025 ජන. - මාර්. (එ.ජ.ඩොලර් මිලියන) | 2026 ජන. - මාර්. (එ.ජ.ඩොලර් මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **ජංගම ගිණුමේ ශේෂය** | 478.8 | 44.6 | -90.7 | 947.7 | 531.5 | -43.9 |
| **වෙළඳ ශේෂය** | -395.6 | -879.7 | | -1,539.6 | -2,310.3 | |
| වෙළඳ භාණ්ඩ අපනයන | 1,241.7 | 1,254.3 | 1.0 | 3,347.4 | 3,460.8 | 3.4 |
| වෙළඳ භාණ්ඩ ආනයන | 1,637.3 | 2,134.1 | 30.3 | 4,887.0 | 5,771.2 | 18.1 |
| **සේවා ගිණුම (ශුද්ධ)** | 393.3 | 226.6 | -42.4 | 1,220.0 | 973.1 | -20.2 |
| සේවා ගිණුම - ලැබීම් | 665.0 | 541.7 | -18.5 | 2,035.1 | 1,929.8 | -5.2 |
| *එයින්,* | | | | | | |
| සංචාරක ඉපැයීම් (ආ) | 354.0 | 223.7 | -36.8 | 1,122.3 | 954.0 | -15.0 |
| මුහුදු සහ ගුවන් ප්‍රවාහන සේවා | 152.4 | 153.7 | 0.8 | 489.0 | 461.7 | -5.6 |
| පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ සේවා | 74.5 | 60.9 | -18.3 | 202.0 | 177.4 | -12.2 |
| සේවා ගිණුම - ගෙවීම් | 271.7 | 315.1 | 16.0 | 815.2 | 956.7 | 17.4 |
| *එයින්,* | | | | | | |
| විදේශ සංචාර | 68.8 | 98.3 | 42.9 | 199.2 | 369.2 | 85.4 |
| මුහුදු සහ ගුවන් ප්‍රවාහන සේවා | 69.8 | 70.3 | 0.6 | 269.3 | 203.0 | -24.6 |
| **ප්‍රාථමික ආදායම් ගිණුම (ශුද්ධ)** | -198.7 | -104.5 | | -505.5 | -395.5 | |
| ප්‍රාථමික ආදායම් ගිණුම - ලැබීම් | 66.8 | 71.6 | 7.3 | 150.1 | 183.6 | 22.3 |
| ප්‍රාථමික ආදායම් ගිණුම - ගෙවීම් | 265.5 | 176.1 | -33.7 | 655.7 | 579.0 | -11.7 |
| *එයින්,* | | | | | | |
| සෘජු ආයෝජන ආශ්‍රිත | 130.7 | 85.3 | -34.7 | 277.9 | 218.9 | -21.2 |
| විවිධ ආයෝජන ආශ්‍රිත | 40.4 | 42.6 | 5.4 | 117.1 | 156.0 | 33.2 |
| අනෙකුත් ආයෝජන: පොලී | 91.0 | 47.0 | -48.3 | 254.0 | 198.7 | -21.8 |
| **ද්විතීයික ආදායම් ගිණුම (ශුද්ධ)** | 679.8 | 802.3 | 18.0 | 1,772.9 | 2,264.2 | 27.7 |
| *එයින්,* | | | | | | |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් [1] | 693.3 | 814.8 | 17.5 | 1,814.4 | 2,294.9 | 26.5 |
| පෞද්ගලික සංක්‍රාම ගෙවීම් | 13.6 | 12.6 | -7.5 | 42.0 | 30.9 | -26.4 |
| **මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම්** | | | | | | |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් (ඇ) | -5.7 | -10.2 | | -36.0 | -62.4 | |
| රාජ්‍ය සුරකුම්පත් වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් | 49.2 | -63.9 | | 92.5 | 6.20 | |
| සංචිතවල සිදු වූ වෙනස්වීම් (ඈ) | 444.4 | -243.6 | | 408.6 | 188.1 | |

**මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ**

(අ) තාවකාලික

(ආ) සංචාරක පැමිණීම්, සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකු විසින් දිනක් සඳහා දරන සාමාන්‍ය වියදම් මත පදනම්ව සංචාරක ඉපැයීම් ගණනය කෙරේ. සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය මාසිකව වෙනස් වන අතර, සංචාරක ආගමන දත්ත මත පදනම් වේ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවත්වන ලද සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංචාරකයෙකු විසින් එක් දිනක් තුළ දරන වියදමෙහි සාමාන්‍යය 2025 වසරේ අගෝස්තු මාසයේ සිට සංශෝධනය කරන ලදී.

(ඇ) ප්‍රාථමික සහ ද්විතීයික ගනුදෙනු ඇතුළත්ව

(ඈ) සංචිත වත්කම් තත්ත්වයට බලපාන තක්සේරු වෙනස්වීම් ඇතුළත් වේ

[1] *විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට දිරිවා සුළි කුණාටුවෙන් පසුව ලැබුණු ප්‍රේෂණ වැනි වෙනත් ප්‍රේෂණ ඇතුළත් විය හැකිය.*